# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. } L2/1/89/චක්‍රලේඛ/2022
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2022.02.01

චක්‍රලේඛ අංක **2022/02**

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු/ ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

සියලුම සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

<u>ඉඩම් කච්චේරි මගින් තෝරාගනු ලබන පුද්ගලයන්ගේ ඉඩම්වලට අදාළ</u>

<u>තක්සේරු වර්ෂය තීරණය කිරීම</u>

උක්ත කරුණට අදාළව මා විසින් ඔබ වෙත එවන ලද අංක 4/1/ප්‍රතිපත්ති-1 හා 2012.12.11 දිනැති උපදෙස් පත්‍රිකාව හා බැඳේ.

02. ඉඩම් කච්චේරි මගින් තෝරාගනු ලබන පුද්ගලයන්ගේ ඉඩම්වලට අදාළ තක්සේරු වර්ෂය තීරණය කිරීම සම්බන්ධයෙන් උක්ත ලිපිය මගින් ලබා දී තිබූ ප්‍රතිපත්ති තීරණය සංශෝධනය කිරීම සඳහා ගරු ඉඩම් අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බව අංක 4-2/1/12-15 හා 2021.12.24 දිනැති ලිපිය මගින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා ඇත.

03. ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කච්චේරි මගින් තෝරාගනු ලබන පුද්ගලයන්ගේ ඉඩම්වල තක්සේරු වර්ෂය තීරණය කිරීමේදී පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1. යම් පුද්ගලයෙකු ඉඩම් කච්චේරියක් මගින් තෝරාගෙන තිබේනම් එම පුද්ගලයා වෙත ලබා දෙනු ලබන ඉඩමේ තක්සේරු වර්ෂය විය යුත්තේ ඉඩම් කච්චේරිය පැවැත්වූ වර්ෂයයි.
2. එසේ වුවද, යම් පුද්ගලයෙකු ඉඩමේ භුක්තියට පැමිණ වසර දෙකකට වඩා වැඩි කාලයකට පසුව ඉඩම් කච්චේරියක් පවත්වා එම පුද්ගලයා තෝරාගෙන තිබේනම්, එම පුද්ගලයා ඉඩමේ භුක්තියට පැමිණි වර්ෂය ඉඩමේ තක්සේරු වර්ෂය ලෙස යොදාගත හැකි වේ.
3. එසේ යම් පුද්ගලයෙකු ඉඩමේ භුක්තියට පැමිණි වර්ෂය තක්සේරු වර්ෂය සේ සලකා කටයුතු කරන අවස්ථාවලදී, එම වර්ෂයේ ජනවාරි පළමු දිනය බද්ද ආරම්භ වන දිනය සේ සලකා කටයුතු කළ යුතු වේ.


ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 🖷 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 🖷 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 🖷 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 🖷 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 7482 🖷 011 288 3635

E-mail - landcom@landcommdept.gov.lk    Web Address - www.lancommdept.gov.lk

4. යම් පුද්ගලයෙකු ඉඩම් කච්චේරි දිනට වසර දෙකකට පෙර සිට යම් රජයේ ඉඩමක් භුක්ති විඳින්නේ නම් භුක්තියට පැමිණි වර්ෂය විධිමත් ලේඛන මගින් සනාථ කළ යුතු වේ. ඒ සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් හෝ කිහිපයක් යොදාගත හැකි අතර එම ලේඛන අදාළ ඉඩම සඳහාම නිකුත් කරන ලද ලේඛන බවට තහවුරු කරගත යුතු වේ.

   (i) පදිංචිය සනාථ කරන ඡන්ද හිමි නාම ලේඛනයේ උද්ධෘත

   (ii) ඉඩමට අදාළ විදුලි බිල්පත්

   (iii) ඉඩමට අදාළ ජල බිල්පත්

   (iv) ඉඩමට අදාළ වරිපනම් ගෙවූ ලේඛන හෝ

   (v) පදිංචිය සනාථ කරන පිළිගත හැකි වෙනත් ලේඛන

5. රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින පුද්ගලයන් පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණයක් සිදුකර ඇත්තේ 1979 වර්ෂයේ වන බැවින් යම් පුද්ගලයෙකු ඉඩමේ භුක්තිය සනාථ කළ යුතු වන්නේ 1979 වර්ෂයට මෙපිට වර්ෂයක් සඳහා විය යුතුය.

6. එසේම ඉඩමේ භුක්තිය සනාථ කරන දිනට අදාළ පුද්ගලයාගේ වයස අවු. 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, භුක්තිය සනාථ කරන ලේඛන බදු ඉල්ලුම්කරු නමින්ම සකස් කළ ලේඛන විය යුතුය. එසේ වුවද, ඉල්ලුම්කරුගේ ආසන්නතම ලේ ඥාතියෙකු විසින් ඉඩම භුක්ති විඳ ඇති බව හා ඉල්ලුම්කරු උපන් දා සිට එම ඉඩම භුක්ති විඳ ඇති බව ලේඛන මගින් සනාථ කරන්නේ නම්, මුල් භුක්තිකරු විසින් ඉඩමේ භුක්තියට පැමිණි වර්ෂය ඉඩමේ තක්සේරු වර්ෂය වශයෙන් යොදාගත හැකිය. එවැනි අවස්ථාවකදී බදු කාල කිහිපයක් සඳහා එකවර බදු අනුමැතියක් ලබා ගැනීමට සිදු වන්නේ නම් 2017/1, 2018/2 හා 2020/4 (I) චක්‍රලේඛවල ප්‍රතිපාදන නියමිත පරිදි අදාළ කරගත යුතු වේ.

7. ඉහත සඳහන් යෝජනා රජයේ ඉඩම් ආඥා පනත යටතේ පුද්ගලයන් තෝරා ගැනීමේදී මෙන්ම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි පන්තියේ නොවන පුද්ගලයන් තෝරා ගැනීමේදී ද අදාළ කරගත යුතුය.

8. ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනතේ ගැනුම් මිල යටතේ බලපත්‍ර ලබාදීමට අදාළ තක්සේරු වර්ෂය සංශෝධනය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් වූ විට බලපත්‍රකරුගේ ඉල්ලීම් ලිපිය, භුක්තිය සනාථ කිරීමේ ලේඛන ඔබගේ නිර්දේශ සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමුකර පළාත් ඉඩම් කොමසාරිස්ගේ/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දුන් දීර්ඝකාලීන බදු අනුමැතියකට අදාළව තක්සේරු වර්ෂය සංශෝධනය කිරීමක දී බදුකරුගේ ඉල්ලීම් ලිපිය, භුක්තිය සනාථ කිරීමේ ලේඛන ඔබගේ නිර්දේශ සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවිය යුතු වේ.

9. ඒ අනුව එම අනුමැතිය ලද පසු සංශෝධිත වර්ෂයට අදාළව තක්සේරු වාර්තාවක් රජයේ තක්සේරුකරු වෙතින් ලබාගෙන බද්ද ආරම්භ වන දිනයේ සිට සංශෝධිත තක්සේරුව මත බදු මුදල් හෝ ගැනුම් මිල අයකිරීමට කටයුතු කළ යුතු වේ. එසේ වුවද, අයකර ඇති වාර මුදල හෝ දඩ මුදල සංශෝධනය නොකළ යුතුය. මෙම සංශෝධිත තක්සේරුව මාගේ 2020/4 හා 2020/4(I) චක්‍රලේඛ ප්‍රකාරව නේවාසික කටයුතු සඳහා නිදහස් දීමනාපත්‍ර ලබාදීමේදී ද අදාළ වන බව සැලකිය යුතුය.

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වෙතොත් කරුණාකර මා වෙතින් වැඩිදුර උපදෙස් ලබා ගැනීමට ක්‍රියා කරන්න.

ජී.ඩී. කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. ප්‍රධාන තක්සේරුකරු - කා.දැ.ගැ.ස.
4. ඉඩම් කොමසාරිස් I, II, III - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.